# e - ඥාන පියස වැඩසටහන
# දියමන්ති ව්‍යාපෘතිය
# 4 සතිය

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 2.2.1 ස්වභාවික හා නිර්මිත වස්තූන් නිරීක්ෂණය කර සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි |

**<u>ඉගෙනුම් ආධාරක</u>**

- පහත දී ඇති ද්‍රව්‍ය සම්පිණ්ඩන රූප සටහන් හොඳින් නිරීක්ෂණය කරන්න
- ඇඳීමට ප්‍රථම මෙම ද්‍රව්‍යන්හි ඇති සරල හැඩ පිළිබඳ අවබෝධ කරගන්න.
- පැන්සල භාවිතයේ දී මෙම රූප සටහන්හි පෙනෙන ආකාරයට පැන්සල හැසිරවීමට උත්සාහ කරන්න.
- ද්‍රව්‍ය බලා ඇඳීමේදී පර්යාවලෝකය එළිය අඳුර ගැඹුර සමබරතාව යන සිද්ධාන්ත ඉතා වැදගත් වේ.
- විශේෂයෙන්ම ඝන වස්තු ඇඳීමේ දී පර්යාවලෝක රීතිය 100% ක් නිවැරදිව ඇඳීම අනිවාර්ය වේ.

**(පර්යාවලෝකය - ළඟ ඇති වස්තූන් විශාලවත් දුර ඇති වස්තූන් ඈතට යන විට කුඩාවටත් පෙනීම.)**

**ක්‍රියාකාරකම**

ඝනකාභය හැඩති වස්තුවක්, මැටි බඳුනක බහාලූ අරලිය අත්තක්, අත් පන්දුවක් හෝ පා පන්දුවක් සම්පිණ්ඩනය කර වර්ණ කිරීම











**ඇගයීම**

- පහත ඔබට දී ඇති ආදර්ශ රූප සටහන් ආශ්‍රයෙන් ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- එක් එක් ද්‍රව්‍ය වෙන වෙනම දළ සටහන් අඳින්න.
- ඒවා ඇඳීම සඳහා මින් ඉහත ඔබ ඉගෙන ඇති සරල රේඛා අභ්‍යාස උපයෝගී කරගන්න.
- මූලික රේඛා අධ්‍යයනය සඳහා 2 B පැන්සල භාවිතා කරන්න.
- ඉන් අනතුරුව එළිය අඳුර දැක්වීම ට 4 B/6 B පැන්සල් භාවිතා කරන්න
- ඔබ වෙන වෙනම ඇඳගත් ද්‍රව්‍යයන් එක් තලයක සම්පිණ්ඩනය කරන්න.
- එසුව පැන්සල් භාවිතයෙන් රේඛාවෙන් එළිය අඳුර දක්වන්න.
- ඒ සඳහා ඉහත රූප සටහන්හි දක්වා ඇති පැන්සල් රේඛා ශෛලීන් අනුගමනය කරන්න.




